ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2026 . 03 . 20 |

පැමිණිලිකාරිය : ශකිලා බානු අසරක්
255 ඒ, ඒ9 පාර,
වව්නියා.

වගඋත්තරකරුවන් : 01. ප්‍රධාන ලේකම්
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු පළාත සභාව,
පළාත් සභාව සංකීර්ණය, යාපනය.

02. අධ්‍යක්ෂ ජනරාල්
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය, මහනුවර.

03. පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂක
උතුරු පළාත් සභාව,
නො: 15, නල්ලුර් හරස්පාර,
නල්ලුර්, යාපනය.

04. ප්‍රධාන අභ්‍යන්තර විගණක,
පළාත් අභ්‍යන්තර විගණක කාර්යාලය,
පළාත් සංකීර්ණය - යාපනය

05. ලේකම්
උතරු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය,
උතුරු පළාත.

**<u>පැමිණිලි අංක : HRC/V/57/2020 (V)</u>**

**පැමිණිල්ලේ කරුණු දැක්වීම සහ ඉල්ලා සිටින සහනය :**

පැමිණිලිකාරිය විසින් ඉහත අංක දරණ සහ 2020.05.12 දිනැති පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වව්නියාව ප්‍රාදේශිය කාර්යාලයට ඉදිරිපත් කරමින් කියා සිටින්නේ ; පැමිණිලිකාරිය වව්නියා දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යාක්ෂක කාර්යාලයේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂක

වශයෙන් කටයුතු කරන අතර ඇය සමග තිබෙන පෞද්ගලික අමනාපය මත තමන්ගේ රාජකාරිය නිසියාකාරව ඉටු කිරිමට ඉඩ ලබා නොදීම, ගරුත්වයට හානි ඇති කිරීම, නොගැලපෙන ආකාරයේ පැමිණිලිකාරිය සමග සන්නිවේදනයන් පැවැත්වීම, නීතිවිරෝධී මූල්‍ය කටයුතු වලට යෙදීමට පෙළඹවීම, සමානයන් අතර අසාමාන්‍ය ලෙස සැලකීම, විධිමත් ක්‍රමවේදයකින් තොරව ස්ථාන මාරුව ලබාදීම, කොරෝනා වසංගතය පැවති අවස්ථාවේදි ද රජයේ නිල නිවාසයේ සිට තමන්ගේ පවුලේ සාමාජිකයින් සමග නිල නිවස නැවත භාර දෙන ලෙස බල කිරීම යන ආදි ක්‍රියාවලින් වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවත් මේ පිළිබඳව සාධාරණ පරික්ෂණයක් සිදු කොට ලබා දෙන ලද ස්ථාන මාරුව නිවැරදි කරන ලෙසත් පැමිණිලිකාරියගේ රාජකාරියට බාධා වන ආකාරයට කටයුතු කල නිලධාරින්ට එරෙහිව නිසි ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසත් මෙතෙක් කල් පැමිණිලිකාරියට සිදු කරන ලද මානසික පීඩනය, අපකිර්තියට ලක් කිරීම, පවුල් ජිවිතයට එල්ල කල බලපෑම් වලට වන්දි හා අවශ්‍ය පියවර ගන්නා ලෙසට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් සහන වශයෙන් අයැද සිටි.

මේ පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්වරයාගෙන් සහ උතුරු පළාත් ප්‍රධාන ලේකම්ගෙන් වාර්තා කැඳවා ඇත. අදාල කැඳවීමට අනුව පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂක ජනරාල්ගේ අංක ප/1/7/1/4(2020)-2 දරණ සහ 2020.06.22 දිනැති වාර්තාව ප්‍රාදේශිය කාර්යාලය වෙත ලැබී ඇත. අදාල වාර්තාවේ 2 වන අයිතමයට අනුව " **ඒ.ශකිලා බානු මිය උතුරු පළාත් සභාවට අනුයුක්තව රාජකාරි සිදු කරන ලද කාලය තුලදී ඇයට එරෙහිව දූෂණ චෝදනා එල්ල වී ඇති බැවින් ඒ සම්බන්ධව විමර්ශන කටයුතු සිදු කරමින් පවතින බැවින් එම විර්ශන කටයුතු නිදහස් හා සාධාරණ ලෙස පැවැත්වීම සඳහා ඒ මහත්මිය උතුරු පළාත් සභාවෙන් පිටතට ස්ථාන මාරු කිරීමට උතුරු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක NP/01/01/Tfr හා 2020.01.16 දිනැති ලිපියෙන් (ඇමුණුම 01) මා වෙත දන්වා ඇත**" ලෙස සඳහන් කර ඇත. තවද අදාල වාර්තාවේ 3 වන අයිතමයේදි පැමිණිලිකාර ඒ.ශකිලා බානු මිය වව්නියාව දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂක කාර්යාලයේ සිට පැල්වෙහෙර ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලයට ස්ථාන මාරු කල බවත් ඒ සඳහා මහවැලි කෘෂිකර්ම වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ නියෝග ලැබී ඇති බවත් (ඇමුණුම 03) පසුව මහවැලි කෘෂිකර්ම වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියෙන් පැමිණිලිකාරියට ලබා දි තිබූ ස්ථාන මාරුව අවලංගු කර වව්නියාව ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය යනුවෙන් සංශෝධනය කර ක්‍රියාත්මක කිරීමට නැවත නියෝගය ලබා දී ඇති (ඇමුණුම 04) බවත් ඊට අනුකූලව පැමිණිලිකාරිය 2020.03.04 දින වව්නියාව කෘෂිකර්ම විද්‍යාලයේ රාජකාරි සඳහා වාර්තා කර ඇති බවත් (ඇමුණුම 05) ප්‍රකාශ කර සිටි. තවද අදාල වාර්තාවේ 4 වන අයිතමය අනුව මෙම ස්ථාන මාරුව ලබා දි ඇත්තේ උතුරු පළාත් ප්‍රධාන ලේකම්ගේ ලිපියෙන් (ඇමුණුම් 01) කල දැනුම් දිමට පරිදි ය. මෙම ස්ථාන මාරුවට අදාලව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත පැමිණිලිකාර ඒ.ශකිලා බානු මහත්මිය පිළිබඳ චෝදනාවක් ලැබී නොමැති අතර උතුරු පළාත් ප්‍රධාන ලේකම්ගේ ලිපිය අනුව එම පළාත් සභාව වෙත මෙම

නිලධාරිනිය සම්බන්ධයෙන් චෝදනා එල්ල වී ඇති බවට පැහැදිලිව සඳහන් කර ඇති බවත් ඒ අනුව නිලධාරිනිය එවැනි චෝදනා එල්ල වන කාලය තුල රාජකාරි කර ඇත්තේ උතුරු පළාත් සභාවේ වන බැවින් පැමිණිලිකාරියගේ වැඩ, පැමිණීම හා හැසිරීම සම්බන්ධව යම් අභ්‍යන්තර/බාහිර පාර්ශවයක් විසින් කරන චෝදනා ගැටලු යොමු වන්නේ උතුරු පළාත් සභාවට බව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් ඔහුගේ වාර්තාවේ සඳහන් කර සිටී.

තවද චෝදනා සම්බන්ධව මූලික පරීක්ෂණ පැවැත්වීම් පහසු වනු පිණිස මෙම ස්ථාන මාරුව ක්‍රියාත්මක කර ඇති බවද එම නිසා පැමිණිලිකාරියට එරෙහිව ලැබී ඇති චෝදනා හා ඒ සම්බන්ධ තොරතුරු උතුරු පළාත් සභාව විසින් විමසීම සුදුසු බව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් නිර්දේශ කර සිටී. තවද ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට බලතල ඇති මහවැලි කෘෂිකර්ම වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 2/2/1/7/2/2vi වන වෙලුම සහ 2020.03.02 දිනැති ලිපියේ නියෝග මත ස්ථාන මාරුව ලබා දී ඇති (ඇමුණුම 02) බව සඳහන් කර සිටී.

මේ පිළිබද උතුරු පළාත් සභා ප්‍රධාන ලේකම් අ.පත්තිනාතන් මහතාගේ අංක NP/02/01/AG/TRN දරණ සහ 2020.06.03 දිනැති වාර්තාව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වව්නියාව ප්‍රාදේශිය කාර්යාලයට ලැබී ඇත. අදාල වාර්තාවේ 01 වන අයිතමයේදී ප්‍රධාන ලේකම්වරයා, ආයතන සංග්‍රහයේ XLViii හි 31:16 වගන්තියට අනුව පැමිණිලිකාරියගේ ස්ථාන මාරුව නිර්දේශ කල බව ප්‍රකාශ කර සිටී. එකී වාර්තාවේ 2 වන අයිතමයට අනුව උතුරු පළාත් ප්‍රධාන ලේකම්, 2019.06.27 වන දින උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පැවති විගණන කළමනාකරණ රැස්වීමේදි වව්නියා දිස්ත්‍රික් නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂක වන පැමිණිලිකාරිය සහ මුලතිව් දිස්ත්‍රික් නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂක පූලකනාදන් මහතා අතර සිදු වූ බහින්බස්වීම් සහ රැස්වීම් අවසාන වීමෙන් පසු දෙදෙනා අතර ඇති වූ ගැටුම පිළිබදව පැමිණිලි, වව්නියාව කෘෂිකර්ම නිලධාරින්ගේ මූල්‍ය අක්‍රමිකතා සහ එයට සහය ලබා දුන් උතුරු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් දෙහිවෙන්දිරම් යන අය ලබා ගෙන ඇති ලාභ ප්‍රයෝජන පිළිබදව යන මාතෘකාව යටතේ ලැබුණු 2019.06.29 දිනැති ලිපිය, අමාත්‍යාංශයේ ලේකම් ටි.දෙහිවෙන්දිරම් මහතාගේ අයුක්ති සහගත ක්‍රියාකලාපය යන මාතෘකාව යටතේ ලැබුණු 2019.07.03 දිනැති ලිපිය, වව්නියාව දිස්ත්‍රික් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂක කාර්යාලයේ සිදුවන මූල්‍ය, පරිපාලන පිළිබද පැමිණිලි, විගණන අවධානය පළාත් විශේෂ සංවර්ධන මූල්‍ය 2018 යන මාතෘකාවෙන් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂක වව්නියාව වෙත සහ අනෙක් අයට පිටපත් වශයෙන් එවා ඇති ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාගේ අංක NP/11/DD/VAVUNIYA/2019/01 දරණ සහ 2019.02.13 දිනැති ලිපියේ සඳහන් වැදගත් කරුණු සහ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාගේ අංක NP/11/DDA/VA/2019/03 දරණ සහ 2019.05.10 දිනැති ලිපියේ සඳහන් වැදගත් කරුණු යන කාරණා සම්බන්ධව පරීක්ෂණ සිදු කොට ක්‍රියාමාර්ග ගනිමින් තිබෙන බව ප්‍රකාශ කර සිටී.

තවද 2019.06.27 වන දින කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විගණන කළමනාකරණ රැස්වීමේදී සිදු වූ සිදුවීම් සම්බන්ධව සත්‍ය දැන ගැනීමේ විමර්ශන කමිටුවක් පත්කල වාර්තාව ලබා ගෙන ඇති බවත් පළාත් අභ්‍යන්තර විගණන ශාඛාවේ වාර්තාවක් ලැබී ඇති බවත් උතුරු පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ම.පැට්‍රික් ටිරංජන් මහතාගේ නායකත්වය යටතේ විමර්ශන කමිටුවක් පත්කර මූලික පරීක්ෂණ සිදුවෙමින් පවතින බවත් මේ පිළිබඳව අතිරේක තොරතුරු ලබා දීමට හැකියාවක් නොමැති බවත් වැඩිදුරටත් දක්වා තිබේ. තවද ආයතන සංග්‍රහයේ XLViii පරිච්ඡේදයේ 31:16 වගන්තියට අනුව ඔහු විසින් පැමිණිලිකාරියව ස්ථාන මාරු කිරීමට නිර්දේශය ලබා දුන් බවත් පළාත් සභාවේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වශයෙන් මුල්‍ය සහ පරිපාලන පිළිබඳ රාජකාරීන් තමන් හට පවරා ඇති බවත් ඔහු විසින් ලබා දෙන නිර්දේශය නීත්‍යානුකූල බවද අදාල නිර්දේශයට අනුව කෘෂිකර්ම අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ අංක DOA/PA/1/12/2/3 දරණ සහ 2020.02.19 දිනැති ලිපියෙන් මෙම ස්ථාන මාරුව ලබා දී ඇති බවද මූලික විමර්ශන කණ්ඩායමේ වාර්තාව ලැබීමෙන් අනතුරුව වැඩිදුර ක්‍රියාව සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයට සහ පැමිණිලිකාරියගේ පත්වීම් බලධාරියා වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවටද ඉදිරියේදී දැනුවත් කරන බව අදාල වාර්තාවේ ප්‍රකාශ කර සිටී.

මේ පිළිබඳව වව්නියා ප්‍රාදේශිය කාර්යාලයේ 2020.09.23 දින පැමිණිලිකාරිය සහ උතුරු පළාත් ප්‍රධාන ලේකම් කැඳවා පරීක්ෂණයක් සිදුකර ඇති අතර අදාල පරීක්ෂණය සඳහා උතුරු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ පරිපාලන නිලධාරි එස්.කුරුබාකරන් මහත්මිය සහ කළමනාකරණ සේවා නිලධාරි එන්.ගනේෂලිංගම් මහතා වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි අතර එහිදී ද ඔවුන් වගඋත්තරකරුවන් විසින් එවන ලද වාර්තාවේ කරුණු නැවත වාචිකව ඉදිරිපත් කර ඇත. ඉන් අනතුරුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රාදේශිය සම්බන්ධිකරණ නිලධාරි විසින් උතුරු පළාත් සභා ප්‍රධාන ලේකම් අමතා පැමිණිලිකරු පිළිබඳ අවසන් විනය පරීක්ෂණ වාර්තා ලබා ගැනීම යන ශේෂය යටතේ 2020.10.06 දිනැති ලිපිය යොමු කර ඇති අතර එහිදී පැමිණිලිකරුගේ විනය පරීක්ෂණ ගොනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අධ්‍යයනය සඳහා යොමු කර තිබූ අතර එම ගොනුව නිරීක්ෂණය කිරීමේදී පැමිණිලිකාරිය පිළිබඳව වෙනස් ආකාරයට ක්‍රියාකර ඇති බවද පරීක්ෂණය සඳහා අසාධාරණ ලෙස දිගු කාලයක් ගත කර අනවශ්‍ය ප්‍රමාදයක් ඇති කර ඇති බවද අදාල පැමිණිලිකාරිය පිළිබඳව පරීක්ෂණ කමිටු දෙකක් පත් කල බවටද නිරීක්ෂණය වේ.

තවද පැමිණිලිකාරියට විරුද්ධව ගොනු කර ඇති චෝදනා ඇයව දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරුවක් ලබා දීමට තරම් බරපතල චෝදනාවක්ද යන කාරණය සම්බන්ධවත් අවධානය යොමු කරන ලදි. එබැවින් අදාල පරීක්ෂණය සාධාරණ හා ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා ඉතා කඩිනමින් සිදු කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් නොපමාව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වව්නියාව ප්‍රාදේශිය කාර්යාලයේ සම්බන්ධිකරණ නිලධාරි විසින් දන්වා ඇත.

මේ අතරතුර පැමිණිලිකාරියද ඇයට එරෙහිව වගඋත්තරකාර පාර්ශවය විසින් සිදු කරමින් සිටින බව පවසන පරස්පර විරෝධි විනය ක්‍රියාමාර්ග සහ සැලසුම් සහගතව සහ ද්වේශ සහගතව පලිගැනීම්

පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලිකාරිය 2020.02.26 දිනැති ලිපියෙන් තවදුරටත් දැනුවත් කර සිටි අතර මෙම හිරිහැර වලින් තොරව සිටීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.

උතුරු පළාත් සභා පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරයා පැමිණිලිකාරියගෙන් රුපියල් 460550.00 ක මුදලක් දෙපාර්තමේන්තු බැංකු ගිණුමට බැර කරන ලෙස පැමිණිලිකාරියට දන්වා ඇති අතර මෙම ක්‍රියාව පැමිණිලිකාරිගෙන් පලිගැනිමේ චේතනාවෙන් කල ක්‍රියාවක් බවට පැමිණිලිකාරිය සඳහන් කර සිටින හෙයින්, මේ සම්බන්ධව අදාල දෙපාර්තමේන්තු බැංකු ගිණුමේ ඉහත කී මුදල බැර කිරිම කුමක් සඳහා ද යන්න පිළිබඳවත්, පැමිණිලිකාරියගේ යම් කිසි දෝෂයකින් මෙම මුදල දෙපාර්තමේන්තුවට ලැබිය යුතු නම් ඇය විසින් කරන ලද වැරදි කුමක්ද සහ එසේ නම් අදාල වැරදි සම්බන්ධව ඇයට විරුද්ධව විනයානුකුල පියවරක් ගෙන තිබේද යන්න හා ඇයට එරෙහි එකී චෝදනා සනාථ වී තිබේද එසේ නම් අදාල ලේඛන සහ මෙම මුදල් ප්‍රමාණය කව්රුන් තීරණය කලාද යන්න සම්බන්ධව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙස ව්ව්නියා ප්‍රාදේශිය කාර්යාලයේ ප්‍රාදේශිය සම්බන්ධිකරණ නිලධාරි විසින් 2020.11.02 දිනැති ලිපියෙන් උතුරු පලාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරයා වෙත දන්වා ඇත. එකී ලිපියට පිලිතුරු වශයෙන් උතුරු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරයාගේ අංක NP/25/03/02/18-VA දරණ සහ 2020.11.12 දිනැති වාර්තාව වව්නියාව ප්‍රාදේශිය කාර්යාලයට යොමු කර ඇති අතර එකි වාර්තාවට අනුව පැමිණිලිකාරිය වව්නියාව නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරයා වශයෙන් සේවය කල කාල සීමාව තුල කොමාරිකා, සමන් පිච්ච මිලදී ගැනිම් සම්බන්ධව ජාතික විගණකාධිපති කාර්යාලය විසින් NNP2/VN/A/DAP/2018/C/01 දරණ සහ 2019.01.12 දිනැති විගණන වාර්තාව සිදු කල බවත් එකී වාර්තාවට අනුව අධික මිලක් ලබා දී මෙම මිලදී ගැනිම් සිදු කර ඇති බවට සදහන් කර සිටින අතර මෙම ප්‍රශ්නයට විගණක පරික්ෂණයට පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කර ඇති 2019.01.29 දිනැති සහ NP/25(01)/GAu/2019/01 දරණ පිලිතුරු වාර්තාව ජාතික විගණන කාර්යාලය විසින් පිලිගෙන නොමැති බවද සඳහන් කර ඇත. පැමිණිලිකාරිය වව්නියාව නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරයා වශයෙන් සේවය කල අවස්ථාවේදි ගොම සහ කොම්පොස් මිලදි ගැනිම සම්බන්ධව අභ්‍යන්තර විගණන කාර්යාලය විසින් අංක NP/11/BDA/VA/2019/04 දරණ සහ 2019.09.06 දිනැති විගණන පරික්ෂණයක් සිදු කල බවද එහිදි ඉතා අධික මිලක් ලබා දී මෙම ද්‍රව්‍ය ලබා ගෙන ඇති බවට සඳහන් කර ඇති අතර මෙම ප්‍රශ්නයට පැමිණිලිකාරිය විසින් ලබා දෙන ලද 2019.10.18 දිනැති සහ අංක NP/25(01)/Pau/2019/04 දරණ පිලිතුරු වාර්තාව පළාත් අභ්‍යන්තර විගණන කාර්යාලය විසින් පිලිගෙන නොමැති බවද සඳහන් කර සිටි. මෙම මිලදි ගැනිම් හරහා අධික මුදල් ලබා දිම තුල රජයට අලාභයක් සිදු කිරිම හේතුවෙන් ඔහුගෙන් අදාල මුදල නැවත අය කිරිමට ප්‍රධාන ගණන් දිමේ නිලධාරියා වන කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්, උතුරු පළාත් ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වු රැස්විමේදී ගන්නා ලද තීරණයකට අනුව ගණන් දිමේ නිලධාරියා වන පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරයා විසින් අදාල මුදල් ප්‍රමාණය නැවත රජයට ලබා ගැනිමට ක්‍රියාමාර්ග ගත් බව සඳහන් කර සිටි.

තවද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වව්නියාව ප්‍රාදේශිය සම්බන්ධිකරණ නිලධාරි විසින් 2020.11.20 වන දිනැති ලිපියෙන් උතුරු පළාත් සහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයා අමතමින්, පැමිණිලිකාරිය විසින් රජයට මුලායමය පාඩුවක් ඇති කලා නම් ඒ පිළිබදව ආයතන සංග්‍රහයට අනුව කෘෂිකර්ම අධ්‍යක්ෂකවරයා විසින් ගන්නා ලද ක්‍රියාමාර්ගය කුමක්ද පිළිබද කොමිෂන් සභාව දැනුවත් කරන ලෙස දන්වා ඇත. එසේම ප්‍රාදේශිය සම්බන්ධිකරණ නිලධාරි විසින් 2020.11.20 දිනැති ලිපියෙන් උතුරු පළාත් සහා ප්‍රධාන ලේකම් අමතා පැමිණිලිකාරිය විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති ඉහත අංක දරණ පැමිණිල්ලෙන් පැමිණිලිකාරිය පිළිබදව අනවශ්‍ය චෝදනා ද්වේශ සහගතව පලිගැනිමේ චේතනාවෙන් ඉදිරිපත් කර ඒ පිළිබදව විනය පියවරක් ගනිමින් සිටින බවත් අදාල විනය පියවර ආයතන සංග්‍රහයට පටහැනිව කටයුතු කරමින් සිටි බවත් ඒ හරහා අනවශ්‍ය ප්‍රමාදයද ඇති කරමින් සිටින බවත් පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇති බවද දන්වා ඇත. පැමිණිලිකාරියගේ අදාල පැමිණිල්ල සම්බන්ධව අවධානය යොමු කිරිමෙන් අනතුරුව ප්‍රධාන ලේකම්වරයාගෙන්, පැමිණිලිකාරිය පිළිබද මුලික විමර්ශණ්‍ය අවසන් කර තිබේද, ඇයට එරෙහිව චෝදනා පත්‍රය සකස් කර තිබේද, අදාල චෝදනා පත්‍රය කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් හෝ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමු කර තිබේද, එසේ යොමු කර තිබේනම් ඒ සමග අමුණා තිබු ලිපියේ ***(කවරින් ලේටර්)*** පිටපතක් කොමිෂන් සභාවට යොමු කරන ලෙසද ප්‍රාදේශිය සම්බන්ධිකරණ නිලධාරි විසින් උතුරු පලාත් ප්‍රධාන ලේකම්වරයා වෙත දන්වා ඇත.

තවද අදාල ලිපියට පිළිතුරු වශයෙන් උතුරු පළාත් ප්‍රධාන ලේකම් අ.පත්තිනාදන්ගේ අංක NP/02/01/Gen/CL/2020 දරණ සහ 2020.12.04 දිනැති පිළිතුරු ලිපිය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ලැබී ඇත. ඒ අනුව පැමිණිලිකාරිය සම්බන්ධව මුලික පරික්ෂණ, පරික්ෂණ කමිටුව විසින් ලබා දී ඇති බවත් ඒ අනුව ඇය පිළිබද චෝදනා පත්‍රය සකස් කර දෙන ලෙසත් අදාල චෝදනා පත්‍රය ලද විගස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් හරහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යොමු කරන බවද සදහන් කර ඇත. ප්‍රධාන ලේකම් අදාල පිළිතුරු ලිපියෙන් තවදුරටත් කියා සිටින්නේ මෙම කාරණා සම්බන්ධව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදි සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාවේ 61 ඒ ව්‍යවස්ථාව 55(1), 57(1), 58(1) යනාදී ව්‍යවස්ථාව සමග එකතු කර කියවීම පිළිබදව කොමිෂන් සභාවේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා ඇත. ව්‍යවස්ථාව 55(1) හි රාජ්‍ය නිලධාරින්ගේ පත්විම්, උසස්විම්, ස්ථාන මාරුවිම් සහ විනය ක්‍රියාමාර්ග යනාදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ලබා දී තිබෙන බව තහවුරු කර ඇති බවත් 57(1) හි රාජ්‍ය සේවා කොමිසම රාජ්‍ය නිලධාරියෙකුට කොමිසමේ පත්විම්, උසස්විම්, ස්ථාන මාරුවිම්, විනය පිළිබද බලය අන්සතු කල හැකි බව සදහන් කර සිටින අතර, ව්‍යවස්ථා 61 ඒ හි ව්‍යවස්ථාවේ 126 වගන්තියේ (1) ; (2) ; (3) ; (4) ; (5) ; යනාදී ජේද වලට අනුව අධිකරණය, විනිශ්චාධිකරණය කොමිෂන් සභාවේ හෝ කොමිසමේ බලය ලබා ගෙන තිබෙන රාජ්‍ය නිලධාරියෙක් විසින් කටයුතු කරන ලද විෂය සම්බන්ධව ප්‍රශ්න කිරිමට හෝ විමර්ශනය කිරිමේ බලය නොමැති බවට පැහැදිලිව සදහන් කර තිබෙන බව ප්‍රධාන ලේකම්වරයා අදාල පිළිතුරු වාර්තාවේ සදහන් කර ඇත.

තවද පැමිණිලිකාරිය මෙම බලය ලබා දෙන ලද රාජ්‍ය නිලධාරියාගෙන් ඇය අසාධාරණයට ලක් වුයේ නම් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පැමිණිල්ලක් ලබා දිය හැකි බව ව්‍යවස්ථාවේ 58(1) වගන්තියේ ඉතා පැහැදිලිවම සදහන් කර ඇති බව ඒ මගින් තවදුරටත් ප්‍රකාශ කර සිටී. ඒ අනුව මෙම කාරණා පිළිබඳව පැමිණිලිකාරිය දැනුවත් කරන ලෙසද ප්‍රධාන ලේකම් අදාල වාර්තාවේ සදහන් කර ඇත. ප්‍රධාන ලේකම්වරයාගේ 2020.12.04 දිනැති පිළිතුරු ලිපියට නැවත වව්නියාව ප්‍රාදේශිය සම්බන්ධිකරණ නිලධාරි විසින් 2020.12.14 දිනැති ලිපියෙන් සදහන් කර සිටින්නේ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාවේ බලය හොඹ වන රාජ්‍ය නිලධාරියෙකුගේ ක්‍රියාදාමය ප්‍රශ්න කිරිමට හැකියාවක් නොමැති බව කියා සිටියත් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සදහන් පරිදි පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් වැළැක්විමට හෝ ප්‍රතික්ෂේප කිරිමට නොහැකි බවත් මෙම නීතිමය තත්වය ප්‍රධාන ලේකම් හෝ අදාල ආයතනයටද අදාල බව සිහිපත් කර සිටින අතර පැමිණිලිකාරිය සදහන් කර සිටින චෝදනාව ජාතිය පදනම් කර ගනිමින් පලිගැනිමේ චේතනාවෙන් කර ඇති බවත් ඒ හරහා ප්‍රමාද කර සහ නීතියට පටහැනිව කරන ලද විනය පියවර සහ ස්ථාන මාරුවීම් හරහා පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය තිබෙන බවද සදහන් කර සිටී. මෙවැනි ආකාරයේ ක්‍රියාදාමයන් ව්‍යවස්ථාවේ 12 (1) හා (2) යන වගන්ති වලට අනුව සියලු පුරවැසියන් නීතිය ඉදිරියේ සමාන වන අතර නීතිය සමව ආරක්ෂාව කල යුතු බවත් ජාතිය, ආගම, භාෂාව හා කුලය යනාදීය පදනම් කර ගෙන කිසිදු පුද්ගලයෙකු වෙනසකට ලක් කිරීමේ හැකියාවක් නොමැති බවද එකී ලිපිය මගින් සිහිපත් කර ඇත.

ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ 11, 12 (1) යටතේ පැමිණිලිකාරියගේ මූලික අයිතාවාසිකම් උල්ලංඝණය වීමක් පෙනෙන අතර ව්‍යවස්ථාවේ 11 වගන්තිය යටතේද පැමිණිලිකාරියට අනවශ්‍ය මානසික පීඩනයක් ඇති කිරිමෙන් තවදුරටත් ඇයගේ මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවත් කොමිෂන් සභාවට හැගී යන බවද සදහන් කර ඇත. ප්‍රාදේශිය සම්බන්ධිකරණ නිලධාරි අදාල ලිපියේ 6 වන ඡේදයේ තවදුරටත් ප්‍රකාශ කර ඇත්තේ 1979 කාන්තාවන්ට එරෙහිව සිදු වූ සියලු ආකාරයේ වෙනස්විම් නැති කිරිමේ ජාත්‍යන්තර සම්මුතියට අනුව පැමිණිලි පාර්ශවය කාන්තාවක්වීම නිසාවෙන් පැමිණිලිකාරියව වෙනස් කිරිමට භාජනයවීම කිසිසෙත්ම පිලිගත නොහැකි කාරණයක් බවත්ය. අදාල පැමිණිලිකාර කාන්තාව ඉස්ලාම් ආගමට අනුව තමන්ගේ සංස්කෘතියට අනුව කටයුතු කිරිම නිසාත් වෙනස්කමකට භාජනය වී ඇත්ද යන්න ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අවධානයට ලක් වන බවත් ඉහත කී නීතිමය ප්‍රතිපාදන නොසලකා පැමිණිලිකාරිය වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අදාල පැමිණිල්ල ඉදිරිපත් කරන ලෙසට උපදෙස් ලබා දිමට හැකියාවක් නොමැති බව තවදුරටත් සදහන් කර සිටී.

තවද රාජ්‍ය සේවය තුල පරිපාලන හෝ විධායක ක්‍රියාවලිය හරහා පුරවැසියෙකුගේ මූලික අයිතිවාසිකම් කඩවිමේ ආකාරයට කටයුතු සිදු වුවත් 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ බලතල අනුව ඒ පිළිබඳව විමර්ශනය හෝ පරික්ෂණය කිරිමට සියලු බලතල කොමිෂන් සභාව සතුවන අතර එවැනි අවස්ථාවකදි රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යොමු කිරිම සුදුසු

ක්‍රියාමාර්ගයක් නොවන බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මතය වේ. ඒ අනුව මේ පිළිබඳව තිබෙන සියලු ලේඛන සමග කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලෙසද අදාල ලිපියෙන් උතුරු පළාත් ප්‍රධාන ලේකම්වරයා වෙත දන්වා තිබෙන බව නිරීක්ෂණය වේ.

ඊට අමතරව වව්නියා ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරී ඔහුගේ **2021.02.08 දිනැති ලිපියෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් (රේඛීය අමාත්‍යාංශය) වෙත විනය ක්‍රියාමාර්ගය සහ නිතියට පටහැනි ක්‍රියාවන් යන ශේෂය යටතේ පැමිණිලිකාරියගේ පැමිණිල්ල පිළිබඳව ලිපියක් යොමු කර** ඇති අතර අදාල ලිපියේ පැමිණිලිකාරියට එරෙහිව පලිගැනිමේ චේතනාවෙන් උතුරු පළාත් සභාව තුල ක්‍රියාවන් සිදුවේදැයි සොයා බැලිම සඳහා පැමිණිලිකාරියට එරෙහිව ගන්නා ලද විනය පියවර පිළිබඳව ඇයගේ පෞද්ගලික ගොනුව කොමිෂන් සභාවට කැඳවා ගෙන නිලධාරින් ඉදිරියේ පරික්ෂණයට ලක් කරන ලදි. එහිදි අනාවරණය වු කරුණු අනුව පැමිණිලිකාරියට එරෙහිව විවිධ පුද්ගලයින් විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි වල අත්සන් නොතිබුණු බවද එම පැමිණිල්ලෙන් සමහර පැමිණිලි ගරු ආණ්ඩුකාරවරයා විසින් පළාත් විගණනය හරහා විමර්ශනයට ලක් කල අතර පළාත් විගණකාධිපති දොපර්තමේන්තුව විසින්ද පරික්ෂණයක් සිදු කොට ඇතැම් කාරණා සම්බන්ධව පුලුල් විමර්ශනයක් අවශ්‍ය බව නිර්දේශ කර තිබුණි. අදාල ලිපියේ 2 වන අයිතමයේ පැමිණිලිකාරියට එරෙහිව විනය පරික්ෂණයක් ආරම්භ කලද අදාල පරික්ෂණයට පෙරම පැමිණිලිකාරියට ස්ථාන මාරු ලබා දි ඇති බව නිරීක්ෂණය වන බවත් මෙම ස්ථාන මාරුවට හේතුව කුමක්ද යන්න මානව හිමිකම් කොමිෂන් සභාව විසින් විමසා ඇති අතර ප්‍රධාන ලේකම්ගේ පිලිතුර වී ඇත්තේ විනය පියවර දී සාක්ෂිකරුවන්ට කිසිදු බාධාවකින් තොරව සාක්ෂි ලබා දිම පිණිස බවය. පැමිණිලිකාරියට එරෙහිව මූලික පරික්ෂණය අවසන් කලත්, ඇයට එරෙහිව චෝදනා පත්‍රය සාධාරණ කාලයක් ඇතුලත ලබා දිමට කටයුතු කර නොමැති බවද එකී විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මේ පිළිබඳව සොයා බැලිමේදි උතුරු පළාත් ප්‍රධාන ලේකම් සහ උතුරු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් විසින්ද පැමිණිලිකාරියට එරෙහිව අසාධාරණ සහ අයුක්ති සහගත කටයුතු කරමින් සිටින බවත් මූලික පරික්ෂණයෙන් පසුවද චෝදනා පත්‍රය නිකුත් කර නොමැති අතර අනවශ්‍ය ප්‍රමාද කිරිම තුලින් පැමිණිලිකාරිය තවදුරටත් මානසික හිංසනයට ලක් කිරිමේ චේතනාවෙන් බලධාරින් කටයුතු කරනවාද යන්න පිළිබඳවද අවධානයට ලක්වේ. වගඋත්තරකරුවන්ගේ නීත්‍යානුකුල නොවන එකී ක්‍රියා නිසා පැමිණිලිකාරියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කරන ලද 12(1), 12(2) මූලික අයිතිවාසිකම් වලට සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද පටහැනිව අදාල වගඋත්තරකාර බලධාරින් කටයුතු කරන බව නිරීක්ෂණය වේ. එබැවින් මේ පිළිබඳව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ සහ කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ ඍජු මැදිහත්විම අවශ්‍ය බව සඳහන් කරමින් අදාල අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරී ඔහුගේ ලිපියෙන් ඉල්ලීමක් කර ඇත. එසේම පැමිණිලිකාරියට සහ වගඋත්තරකාර උතුරු පළාත් ප්‍රධාන ලේකම්, උතුරු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂක, කෘෂිකර්ම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) දේවේන්ද්‍රන්

යන අයට 2021.03.23 වන දින වව්නියාව මානව හිමිකම් සභා කාර්යාලයේදී පෙනී සිටින ලෙස සිතාසි යොමු කර ඇත. අදාල පරික්ෂණය සඳහා පාර්ශවකරුවන් පෙනී සිට ඇති අතර, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත වව්නියා මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශිය කාර්යාලයේ සම්බන්ධිකරණ නිලධාරි විසින් 2021.03.02 දිනැති ලිපියෙන් පැමිණිලිකාරියගේ පැමිණිල්ල පිළිබඳව පරික්ෂණය සිදු කරමින් පවතින බැවින් පැමිණිලිකාරිය වෙත ක්ෂණිව ලබා දි ඇති ස්ථාන මාරුව තාවකාලිකව අත්හිටුවන ලෙස ඉල්ලා ඇත. ඒ අතරතුර අංක 2/2/1/9/1/1/1 දරණ සහ 2021.03.09 දිනැති ලිපියෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රාදේශිය සම්බන්ධිකරණ නිලධාරි වෙත යොමු කර ඇත්තේ, පැමිණිලිකාරියගේ විනය පරික්ෂණ කටයුතු වලට අදාලව මුලික විමර්ශන වාර්තාව උතුරු මැද පාළාත් ප්‍රධාන කාර්යාලය මගින් ඔහු වෙත එවා ඇති අතර ඉදිරි කටයුතු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යැවිමට කටයුතු කරන බවත්ය.

තවද කෘෂිකර්ම අධ්‍යක්ෂක ජනරාල් ඔහුගේ අංක ආ/1/8/6/038 දරණ සහ 2021.02.25 දිනැති ලිපියෙන්, ප්‍රාදේශිය සම්බන්ධිකරණ නිලධාරියා විසින් අධ්‍යක්ෂක ජනරාල් අමතා යොමු කර තිබූ 2021.02.08 දිනැති ලිපිය සම්බන්ධව දක්වා ඇත්තේ පැමිණිලිකාරියට දුෂණ හා අක්‍රමිකතා සම්බන්ධයෙන් චෝදනා එල්ල වි ඇති බැවින් ඒ පිළිබඳව නිදහස් සහ සාධාරණ විමර්ශනයක් කිරිම පහසු විම සඳහා මෙම නිලධාරිනිය ස්ථාන මාරුකිරිම උතුරු පළාත් ප්‍රධාන ලේකම් විසින් නිර්දේශ කල බැවින් නිලධාරිනිය වව්නියාව කෘෂිකර්ම විද්‍යාලය වෙත ස්ථාන මාරු කර ඇති බවත් සඳහන් කර ඇත. තවද පැමිණිලිකාරිය පිළිබඳව විමර්ශනය උතුරු පළාත් සභාව මගින් සිදු වන්නක් බැවින් එම විමර්ශන තොරතුරු කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලැබි නොමැති බවද වාර්තා කර ඇත.

පැමිණිලිකාරියගේ පැමිණිල්ලේ ගොනුව අනුව පරික්ෂා කිරිමේදි පැමිණිලිකාරිය තොරතුරු පනත යටතේ කෘෂිකර්ම පශු සම්පත් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ඇය පිළිබඳ විමර්ශනයේ ප්‍රගතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබෙන අතර ලේකම්වරයා විසින් අංක Agri/2/2/1/9/1/1/1 දරණ සහ 2025.01.20 දිනැති ආවරණ ලිපිය පැමිණිලිකාරිය වෙත යොමු කර ඇත. එම ලිපිය සමග පැමිණිලිකාරිය සම්බන්ධව නගා තිබූ චෝදනා පිළිබඳව කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්වරයා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය මත කර ඇති විමර්ශන වාර්තාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යවන ලද පිටපතද යාකොට ඇත. එකී විමර්ශන වාර්තාවේ පැමිණිලිකාරිය සම්බන්ධව ලබා දී තිබූ චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා පහ (5) පිළිබඳව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් විසින් විමර්ශනය කර නිරික්ෂණ ඉදිරිපත් කර තිබුණි. ඔහුගේ නිරික්ෂණයට අනුව පැමිණිලිකාරිය සම්බන්ධව

I වන චෝදනාව, ඒ.ශකිලා බානු මහත්මිය විසින් වව්නියාවේ රජයේ බිජ නිෂ්පාදන ගොවිපොලෙහි පැල කර තිබූ තැඹිලි ගස් 94 ක් කපා දැමීමට උපදෙස්/නියෝග දීම/එසේ කිරිමට ඉඩසැලසිම යන චෝදනාව

II වන චෝදනාව, ඒ.ශකිලා බානු මහත්මියට 2012.01.02 දින සිට 2015 දක්වා හෝ ඊට ආසන්න කාල සීමාව දක්වා අදාල කුලී ගෙවීමකින් තොරව නිල නිවසේ රැදී සිටි බවට චෝදනාව

III වන චෝදනාව, ඒ.ශකිලා බානු මහත්මිය විසින් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂක කාර්යාලයට අයත් අංක EPJZ/8348 දරණ රථය තම පෞද්ගලික කටයුතු සඳහා යොදා ගැනීම හා/හෝ එසේ යෙදවීමට උපදෙස් ලබා දීම සිදු කල බවට චෝදනාව

IV වන චෝදනාව, ඒ.ශකිලා බානු මහත්මිය වව්නියාව නියෝජ්‍ය පලාත් කෘෂිකර්ම අධ්‍යක්ෂක ලෙස ඇයගේ ආසන්නතම දෙපාර්තමේන්තු ප්‍රධානියා වන උතුරු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙත ප්‍රතිචාර නොදැක්වීම සිදු කල බවට චෝදනාව

V වන චෝදනාව, ඒ.ශකිලා බානු මහත්මියට දිස්ත්‍රික් නියෝජ්‍ය පලාත් අධ්‍යක්ෂක කාර්යාලයේ සේවයේ නිරත නිලධාරින් වෙත තර්ජනය කර ඇති බව යන චෝදනා වශයෙන් චෝදනා 05 ක් පිළිබඳව විමර්ශනය කර නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.

**අදාල චෝදනා පිළිබඳව විමර්ශනය සිදු කිරීමෙන් පසුව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් ජානක ධර්මකිර්ති මහතා විසින් චෝදනා පත්‍රයේ 1 සිට 5 දක්වා චෝදනා සනාථ නොවන බව හා ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග නිර්දේශ නොකරනු ලබන බවත් ඒ.ශකිලා බානු මහත්මිය විසින් 4 වන චෝදනාව සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද නිදහසට කරුණු දැක්වීම හා එකග වන බැවින්ද මෙම චෝදනාව සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම නිර්දේශ නොකරන බවද වැඩිදුරටත් සඳහන් කර ඇත.** තවදුරටත් ඒකී වාර්තාවේ දැක්වෙන්නේ ඒ.ශකිලා බානු මහත්මිය සම්බන්ධයෙන් ඉදිරි විනය ක්‍රියාමාර්ග නිර්දේශ නොකරන බව හා 4 සහ 5 වන චෝදනා සම්බන්ධයෙන් සුදුසු පරිදි අවවාද කිරීම නිර්දේශ කරන බවත්ය.

**නිරීක්ෂණ :**

පැමිණිලිකාරිය සහ වගඋත්තරකාර පාර්ශවය විසින් විටින් විට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කර තිබූ ලේඛන වලට අවධානය යොමු කිරීමේදී නිරීක්ෂණය වන්නේ පැමිණිලිකාර ඒ.ශකිලා බානු නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂකවරිය වශයෙන් වව්නියාවේ සේවය කර ඇති අතර, උතුරු පළාත් සභා ප්‍රධාන ලේකම්වරයා විසින් අත්තනෝමතික ලෙස ස්ථාන මාරුවක් ලබා දී ඇති බවය.

පැමිණිලිකාරිය පිළිබඳව විවිධ වූ පැමිණිලි උතුරු පළාත් සභාවේ ආණ්ඩුකාර වෙත ලැබී ඇති අතර අදාල පැමිණිල්ලේ බොහෝ ප්‍රමාණයන් අත්සන් නොමැති නාඳුනන පුද්ගලයින් විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි වශයෙන් පැවතිමද නිරීක්ෂණය වූ අතර සමහර පැමිණිලි වල නම් ලිපිනයන් ආදිය සඳහන් වී තිබීමද නිරීක්ෂණය විය. අදාල විවිධ පැමිණිලි සම්බන්ධයෙන් උතුරු පළාත් ප්‍රධාන ලේකම්වරයා මූලික විමර්ශන ආරම්භ කර තිබීමද නිරීක්ෂණය වේ. පැමිණිලිකාරිය පිළිබඳව විවිධ

පැමිණිලි ලැබුණත් අදාල පැමිණිලි සම්බන්ධව පැමිණිලිකාරියගෙන් කරුණු විමසීමක් මුල් අවස්ථාවේදී සිදු කර නොමැති බවද නිරීක්ෂණය වේ.

එසේම, උතුරු පළාත් ප්‍රධාන ලේකම්වරයා විසින් 2020.01.16 වන දින කෘෂිකර්ම අධ්‍යක්ෂක ජනරාල්, පේරාදෙණිය වෙත යොමු කල ලිපියේ සිදුකල විමර්ශනයක් පදනම් කර ගෙන පැමිණිලිකාරියට ස්ථාන මාරුවක් නිර්දේශ කල බව සටහන් කර තිබුණද අදාල දින වන විටත් කිසිදු විමර්ශනයක් ආරම්භ කර නොමැති අවස්ථාවක පැමිණිලිකාරියව උතුරු පළාතෙන් පිටතට ස්ථාන මාරු කරන ලෙසට ඉල්ලීමක් කර ඇති බවද නිරීක්ෂණය වේ. මෙම දිනයේදී හෝ ඉන් පෙර හෝ කිසිදු පරීක්ෂණයක් හෝ විනය කටයුත්තක් ගෙන නොමැති බව පැමිණිලිකාරියට අදාල ලිපිගොනු පරීක්ෂාවේදී හා මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණය මගින්ද කොමිෂන් සභාව සනාථ කර ගෙන ඇත. කරුණු මෙසේ හෙයින් ප්‍රධාන ලේකම් විසින් පරීක්ෂණ පැවැත්වූ බවට අසත්‍ය ලෙස ප්‍රකාශ කර තිබීම වගකිවයුතු රාජ්‍ය නිලධාරියෙකු ලෙස නිසි පරිපාටිය අනුව හා අවංක භාවයෙන් යුතුව ඔහුගේ පරිපාලන කටයුතු සිදුකර නොමැති බවද නිරීක්ෂණය වේ.

ප්‍රධාන ලේකම්ගේ 2020.01.16 වන දිනැති ලිපියෙන් සාක්ෂිකරුවන් හට පැමිණිලිකාරිය තර්ජනය කරන බව සඳහන් කර තිබුණත් පරීක්ෂණයේදී පෙනී ගියේ පැමිණිලිකාරිය එවැනි තර්ජනයක් කල බවට කිසිදු සාක්ෂියක් නොමැති බවත්ය. තවද පැමිණිලිකාරිය විසින් යම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයින්ට කුමන ආකාරයකින් හෝ තර්ජනයක් සිදු කර තිබේනම් ඒ පිළිබඳව යාබද පොලිස් ස්ථානයේ පැමිණිලි කිරීමට අවස්ථාව තිබූ අතර, එවැනි පැමිණිල්ලක් ඉදිරිපත් කල බවටද කිසිදු ලේඛනයක් මගින් සනාථ නොවේ.

තවද පැමිණිලිකාර ශකිලා බානු මහත්මියට එරෙහිව පැමිණිලි කොපමණ ප්‍රමාණයක් ලැබුණා වුවද එවා විමර්ශනය කිරීමට පැමිණිලිකාරිය සේවය කරන දෙපාර්තමේන්තුව උතුරු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්වරයාගේ පාලනයට යටත් වූ බැවින් උතුරු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා මගින් පරීක්ෂණයක් සිදුකර නොමැති බවද නිරීක්ෂණය වේ. පැමිණිලිකාරියගේ ස්ථාන මාරුව පිළිබඳ සෘජු බලධාරියා වන උතුරු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් විසින් අදාළ ස්ථාන මාරුව නිර්දේශ නොකර තිබීමද මෙහිදී පැහැදිලිව පෙනී යන කරුණකි.

තවද පැමිණිලිකාරියව ප්‍රධාන ලේකම් විසින් ස්ථාන මාරු කරන ලෙස කෘෂිකර්ම අධ්‍යක්ෂක ජනරාල් වෙත නිර්දේශ කිරීම පමණක් සිදු කල බවට නිරීක්ෂණය වන අතර කෘෂිකර්ම අධ්‍යක්ෂක ජනරාල් මානව හිමිකම් වව්නියාව ප්‍රාදේශීය කාර්යාලය වෙත යොමු කර තිබූ 2020.06.22 දිනැති ලිපියේ සඳහන් වන්නේ උතුරු පළාත් ප්‍රධාන ලේකම් විසින් සිදු කල ඉල්ලීමකට අනුව පැමිණිලිකාරිය වෙත ස්ථාන මාරුව ලබා දුන් බවත්ය. පැමිණිලිකාරිය පිළිබඳව උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් කටයුතු කල ආකාරය සම්බන්ධව කොමිෂන් සභාවේ අවධානය යොමු කිරීමේදී පැමිණිලි විභාග කිරීමට පෙර පැමිණිලිකාරියව උතුරු පළාතෙන් පිටතට ස්ථාන මාරු කරන ලෙස ප්‍රධාන ලේකම් ඉල්ලීම් කල අතර උතුරු පළාත් සභාව ඇතුලත ස්ථාන මාරු කිරීමට ඉල්ලීම් කල හැකි නමුත් උතුරු

පළාතෙන් පිටතට ස්ථාන මාරු කරන ලෙසට ඉල්ලා සිටිම සාධාරණීයකරනය කරන්නේ කෙසේද යන්න ගැටලු සහගතය. පැමිණිලිකාරිය උතුරු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ අනුයුක්ත කොට ඇයට එරෙහිව විමර්ශන කල නොහැක්කේ මන්ද යන ප්‍රශ්නයද එසේ නොමැති නම් වෙනත් දෙපාර්තමේන්තුවකට අනුයුක්ත කල නොහැක්කේ මන්ද යන කාරණාව මෙහිදි අවධානයට ලක් වේ.

පැමිණිලිකාරියට විනය ක්‍රියාමාර්ග ආරම්භ කිරිමට පෙරාතුව ඇයව පළාතෙන් පිටතට ස්ථාන මාරු කරන ලෙසට ඉල්ලා සිටිමට පදනමක් නොපෙනෙන අතර, වර්ෂයකට අධික කාලයක් විමර්ශන සඳහා ගත කිරිම යනාදී මෙම විමර්ශනය යුක්ති සහගත අයුරින් ක්‍රියාත්මක වී ඇති බවට පිලිගැනීමට නොහැකි වි පවති.

තවද ප්‍රධාන ලේකම් ආයතන සංග්‍රහයේ පරිච්ඡේද XLVIII 31:16 වගන්ති ප්‍රකාරව පැමිණිලිකාරියගේ ස්ථාන මාරුව නිර්දේශ කර ඇති බවට සඳහන් කර තිබුණත් පැමිණිලිකාරියව අදාල වන අමාත්‍යාංශය තුල ස්ථාන මාරු කිරිමට හෝ කුමන හේ ආයතනයකට අනුයුක්ත කිරිමට හැකියාව තිබුණත් එලෙස සිදු නොකර කටයුතු කර ඇති බවද නිරික්ෂණය වේ. තවද නිලධාරින් අතර සිදු වු ගැටුමකදි පැමිණිකාරිය පහරදීම් වලට ලක් වී ඇති අතර,ඒ සම්බන්ධව කෝපායි පොලිසියේ පැමිණිල්ලක් කර තිබුණද රෝහල් ගතව දින 3 ක් ප්‍රතිකාරද ගෙන ඇතත් ප්‍රධාන ලේකම් පහර දීම් සිදුකල නිලධාරියාට එරෙහිව කිසිදු පියවරක් නොගෙන පැමිණිලිකාරිය වැරදි කල බව ප්‍රකාශ කිරිම තුල ඇය පිළිබඳව උතුරු පළාත් ප්‍රධාන ලේකම් ද්වේශ සහගතව කටයුතු කර ඇති බවද පෙනී යන්නකි.

තවද ප්‍රධාන ලේකම් විසින් 2020.01.16 දින කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් පේරාදෙණිය වෙත යොමු කල ලිපියෙහි විගණන නිරික්ෂණයන් අනුව අවිධිමත් කටයුතු දක්නට ලැබෙන බව සඳහන් කර ඇතත් විගණන කමිටුව විසින් විමර්ශනයට ලක් කල කරුණ වන කොමාරිකා, පිච්ච මල් මිලදී ගැනිම ප්‍රදර්ශනයට අදාල T-shirt මිලදී ගැනිම, මතුපිට පස් සහ ගොම මිලදී ගැනීම්, ගොයම් කපන යන්ත්‍රය ගොවි පොලෙහි කළමනාකරුවන් විසින් පෞද්ගලික අංශය වෙත කුලියට දීම පිළිබඳව සඳහන් කිරිමේදි පිලිගෙන නොමැති මිලදී ගැනිම් වර්ගය කුමක්ද යන්න පිළිබඳව සඳහන් කර නොමැත.

ඉහත කී කරුණු පිළිබඳ විගණනය ද උතුරු පළාත් ප්‍රධාන ලේකම් යටතේ පවතින අංශයක් මගින් සිදුකර ඇති එකක් බවද නිරික්ෂණය වේ.

පැමිණිලිකාරිය වෙත ලබා දෙන ලද හදිසි ස්ථාන මාරුව හා පැමිණිලිකාරිය පදිංචි රජයේ නිල නිවාසයෙන්ද වහාම ඉවත් වන ලෙසටත්, ඇයට නියෝග කිරිම තුල පැමිණිලිකාරියව තවදුරටත් අපහසුතාවයට පත් කිරිමේ චේතනාවෙන් කටයුතු කර ඇති බවටද නිරික්ෂණය වේ. තවද 2020 මාර්තු ජුනි ආරම්භය දක්වා ගෝලීය වශයෙන් පැතිරුණු කෝවිඩ් වසංගතය හේතු කොට ගෙන ඇඳිරි නීතිය ක්‍රියාත්මක වු අවස්ථාව තුල පැමිණිලිකාරිය සහ ඇයගේ පවුලේ අයට පදිංචි වීමට ස්ථානයක් සෙවීම අසීරු කාර්යයක් බව පැහැදිලිව පෙනී තිබියදී එම කරුණු නොසලකා නිල නිවාසය ලබා ගැනීමට කටයුතු කිරිම, පමණක් නොව පදිංචිව සිටි කාල පරිච්ඡේදයට කුලි දඩ මුදල් අය කිරිමට උත්සහ දැරිම

තුලද පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරයා තවදුරටත් පැමිණිලිකාරිය අපහසුතාවයට පත් කල බව පැහැදිලිව දක්නට ලැබෙන කරුණකි.

තවද පැමිණිලිකාරිය පිළිබඳව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා I, II ,III, IV, V සිදු කරන ලද පරීක්ෂණයේ ඇය පිළිබඳව ඉදිරි විනය ක්‍රියාමාර්ග නිර්දේශ නොකරන බව දන්වා සිටිම තුල පැමිණිලිකාරිය පිළිබඳව වගඋත්තරකාර උතුරු පළාත් ප්‍රධාන ලේකම් සහ උතුරු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරයා පැමිණිලිකාරිය සම්බන්ධව කටයුතු කර ඇති ආකාරය අනුව එකී නිලධාරින් නීතිය ඉක්මවා අත්තනෝමතික ලෙස කටයුතු කර ඇති බවද පෙනී යයි.

ඒ අනුව පැමිණිලිකාරිය සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන නිසි පරිපාටියට අනුව සිදුකර නොමැති බවට ගොනුව පරික්ෂා කිරිමේදි පෙනී යන අතර, පැමිණිලිකාරියට ලබා දෙන ලද ස්ථාන මාරුව පදනම් විරහිත බවට ද පැමිණිලිකාරිය පිළිබඳව වගඋත්තරකාර පාර්ශවය දිගින් දිගටම ද්වේශ සහගතව කටයුතු කර ඇති බවද වගඋත්තරකරුවන්ගේ ක්‍රියා කලාපය රාජ්‍ය නිලධාරින් වශයෙන් අනුමත කල නොහැකි එකක් බවද නිරික්ෂණය වේ.

මෙම අවස්ථාවේදි පැමිණිලිකාරියගේ පත්වීම් බලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වන අතර පැමිණිලිකාරියට අදාල ස්ථාන මාරුව ලබා දි ඇත්තේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව නොවන බව ලේඛන අනුව නිරික්ෂණය වේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු නීත්‍යානුකූල බලය අන්සතු කිරිමක් සිදු කර තිබේද යන්න පිළිබද ගැටළුවක් මතු වේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ලබා දි තිබෙන පත්කිරිම් , උසස්කිරිම් සහ මාරු කිරිමේ බලය එකී සභාව විසින් කල යුතු අතර වෙනත් නිලධාරින් විසින් ඒ පිළිබඳව තිරණය ගැනිම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය තවත් අයෙකු හට අභිනියෝජනයක් කිරිමට ඉඩ සලසා දිමක් වේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවට තමන් සතු සමහර බලතල අභිනියෝජනය කිරිමට ඉඩ සලසා දිය නොහැකි වන අතර එවැනි නෛතික තත්වයක් මෙම අවස්ථාවේදි නිරික්ෂණය වේ.

මෙහිදි ශ්‍රී ලංකා අභියාචනාධිකරණය විසින් 1998 වසරේ **ගුණරත්න එදිරිව චන්ද්‍රානන්ද** සිල්වා නඩුවේදී දක්වා ඇත්තේ රාජ්‍ය නිලධාරියකු ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් අනිවාර්ය නිවාඩු යවා ඇති අතර, ඒ සඳහා වූ අනුමැතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලබාදි ඇති බවද ගරු අධිකරණය විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභවේ ක්‍රියාදාමය ප්‍රශ්නයට ලක් කර ඇති බවදය. අදාළ නඩුවේ පෙත්සම්කරු වන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, ආරක්ෂක ලේකම් විසින් අනිවාර්ය නිවාඩු යවා තිබුණද එම අනිවර්ය නිවාඩු යැවිම අත්තනෝමතික ක්‍රියාවක් බවත් එම ක්‍රියාව නීතිය ඉදිරියේ බලරහිත ක්‍රියාවක් බවත් තවදුරටත් තීරණය කර සිටින ලදි. මෙහිදි සැලකිය යුතු කරුණු වන්නේ පෙත්සම්කරුව අනිවාර්ය නිවාඩු යැවිමට ආරක්ෂක ලේකම් විසින් නිර්දේශ කර එම නිර්දේශය අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට එවා තිබුණු අතර හුදෙක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එකී නිර්දේශය අනුමත කර තිබු පමණින් එය නීත්‍යානුකූල නොවන බවත් මෙම

පෙත්සම්කාරිය අනිවාර්ය නිවාඩු යැවීමට ආරක්ෂක ලේකම් විසින් ගත් තිරණය බල රහිත බවත් තවදුරටත් තීරණය කර සිටින ලදී. අදාල නඩුවේ ලබා දි ඇති තීරණය පහත පරිදි වේ.

**<u>Gunaratne v. Chandrananda De Silva C.A. NO 927/98,</u>** *The petitioner a senior deputy inspector general of police was sent on compulsory leave by letter dated 17.08.96 by the secretary /defense as the Commission of inquiry (Batalanda Commission) had made adverse findings against the petitioner*

*It was contended that the decision to place the petitioner on compulsory leave is ultra vires and therefore is void in law for the reason that the said decision has not been taken by the proper authority-P.S.C.*

*It was very clear that it was the respondent who has decided to place the petitioner on compulsory leave and had thereafter recommended to the PSC that approval be granted to place petitioner on compulsory leave.*

අදාල නඩුවේ තීරණයට අනුව අනිවාර්යය නිවාඩු යැවීම සාධාරණ වුවත් එම තීරණය ගැනිමට අනුගමනය කල ක්‍රමවේදය නීතියට පටහැනි බවත් ගරු අධිකරණය විසින් තීන්දු කරන ලදි.

ඒ ආකාරටයම ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් <u>නඩු අංක **286/24**</u> දී 2024 වර්ෂයේදී පැවැත්වූ 5 වසර ශිෂ්‍යත්ව විභාගයේ දි සිදුවූ අක්‍රමිකතා සම්බන්ධයෙන් තිරණ ගැනිමේදි විභාග පනත ප්‍රකාරව සම්පූර්ණ බලය තිබෙන්නේ විභාග කොමසාරිස් ජනරාල්ට වුවද ඒ පිළිබදව අධ්‍යාපන අමාත්‍යවරයා සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් ගත් තිරණය විභාග කොමසාරිස් ජනරාල් ක්‍රියාත්මක කිරිමෙන් තම නීතිමය වගකීම පැහැර හැර ඇති බවත් ඒකී තීරණය නීතියට පටහැනි අත්තනෝමතික නීති විරෝධි සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) වගන්තියට විරුද්ධ තීරණයක් බව දක්වා සිටින ලදි. එබැවින් එම තිරණය බලරහිත තිරණයක් බව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පෙන්වා දි ඇත. අදාල නඩුවේ ලබා දි ඇති තීරණය පහත පරිදි වේ.

*It is declared that the impugned purported decision of the 1st Respondent-Commissioner General of Examination to award free marks for three answers corresponding to the three compromised questions in part 1 of the grade 5 Scholarship Examination held on 15th September 2024 has been taken contrary to law, is ultra vires, and thus unlawful. In the circumstances of this case the said decision is a nullity, it contravenes article 12(1) of the constitution.* ලෙස තීරණය කර ඇත.

**නිගමනය :**

- ඒ අනුව ඉහත සියලු කරුණු කෙරෙහි අවධානය යොමු කිරිමේදි පැමිණිලිකාරියගේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව අනුව නීතිය ඉදිරියේ

සියල්ලන්ටම සමානව සැලකිය යුතු අතර නීතිය පසදලීම සහ ක්‍රියාත්මක කිරිමද නීතියේ රැකවරණය සර්ව සාධාරණ යුක්තේය යන අයිතිය උල්ලංඝණය වී ඇති බව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :**

1. ඒ අනුව පැමිණිලිකාරිය වෙත ලබා දුන් ස්ථාන මාරුව අවලංගු කිරීමට ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් පියවර ගත යුතුය.
2. පැමිණිලිකාරිය ඇයගේ සේවා ස්ථාන තුල කිසිදු මානසික පීඩනයකින් තොරව තම රාජකාරිය කර ගෙන යාමට අවශ්‍ය පරිසරය සකස් කිරීමට අදාළ බලධාරීන් පියවර ගත යුතුය.
3. පැමිණිලිකාරිය පිළිබඳව නෛතික පදනමකින් තොරව අත්තෝනමතික ආකාරයකින් කටයුතු කල නිලධාරීන් පිළිබඳව එනම්, උතුරු පලාත් සභා ලේකම්, උතුරු පළාත් සභා කෘෂිකර්ම අධ්‍යක්ෂකවරයා පිළිබඳව උතුරු පලාත් ආණ්ඩුකාරවරයා විසින් හා ලේකම් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් පරීක්ෂා කොට ඔවුන් සම්බන්ධව සුදුසු පියවර ගත යුතුය. ගනු ලබන පියවර පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාව දැනුවත් කිරීමට කටයුතු කල යුතුය.

2026.04.28 වන දිනට පෙර මෙකී නිරිදේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වගන්තියට ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම පැමිණිලිකරු විසින්ද එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුල මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, ඒදිනට පෙර අදාළ දැනුම්දීම සිදුනොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොලබන බව වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :

1. අමාත්‍යතුමා - කා.දැ.ගැ.පි.
   කෘෂිකර්ම, පශු සම්පත් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය,
   80/5, ගොවිජන මන්දිරය,
2. ලේකම්, - නිර්දේශය ක්‍රියාත්මක කිරිම සඳහා
   කෘෂිකර්ම, පශු සම්පත් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය,
   80/5, ගොවිජන මන්දිරය.
3. උතුරු පළාත් ආණ්ඩුකාරතුමා, - නිර්දේශය ක්‍රියාත්මක කිරිම සඳහා
   ආණ්ඩුකාර කාර්යාලය - යාපනය.